# Easter Sunday – jesus is the Mega Star 21.04.2019

## පාස්කු ඉරිදා - යේසුස්වහන්සේ විශාලම තරුවයි. 21.04.2019

ඔබ සෑමදෙනාටම ප්‍රීතිමත් සහ ආශීර්වාදලත් පාස්කුවක් වේවා කියා පතන අතරම අද පළමුවරට මෙහි පැමිණ සිටින සියලුදෙනාම සතුටින් පිලිගන්නෙමු.

පාස්කුව ලොව වටා සිටින කිතුණුවන්ට ඉතාමත්ම සතුටුදායක සහ ඉතා වැදගත්ම දවසයි. මළවුන්ගෙන් නැගිටුණු ඉරිදාව නැත්නම් අපේ ඇදහිල්ලෙන් සහ කිතුණුකමෙන් කිසි ප්‍රයෝජනයක් නැත. කිතුණුකම සහ අනෙක් ආගම් අතරේ වෙනසක් දක්වන එක කාරණයක් තිබේනම් ඒ මළවුන්ගෙන් නැගිටුන ඉරිදායි. ඒ මක්නිසාද, අපවෙනුවෙන් යේසුස්වහන්සේ අපේ පව් වෙනුවෙන් මළා පමණක් නොව අප වෙනුවෙන් නැවතත් මරණින් නැගිටුනු නිසාය. යේසුස්වහන්සේ අනුගමනය කිරීම ඉතාමත් උද්යෝගිමත් වෙන්නේ ඒ නිසයි. මක්නිසාද යේසුස්වහන්සේ ඔබ සහ මා තුළ ජීවමානව වැඩ සිටිනසේක.

හාලේලූයා! යේසුස් ජීවමානයි, මරණයේ ජය නැතිවී ඇත කියා අපි ගායනා කළෙමු. එය සාතනික බලවේගයන්, පාපය සහ මරණයේ ජයට එරෙහිවන ජය ගීයකි.

මීට පෙර අප ගායනා කළ ගීත යේසුස් ක්‍රිස්තුස් සුපිරි තරුව ගැන බව ඔබ සමහරු දැනගන්නට ඇති. නමුත් අද මට අවශ්‍යකරන්නේ, යේසුස්වහන්සේ සුපිරි තරුවකට වඩා ලොකු කර ඉතාමත් විශාල තරුවක් වු බව ඔබට පෙන්වීමටයි.

යම්කෙනෙක් තමා සුපිරි තරුවක්යැයි කියා ගන්නා විට සියලුම අවධානය යොමුවන්නේ එම පුද්ගලයා වෙතටයි. එය බොහෝ සේ තමකම කේන්ද්‍රකර ගෙනම පවතී. සුපිරි තරුව කියන්නේ "මා දෙස බලන්න, මම කොයිතරම් ශ්‍රේෂ්ඨ බුද්ධිමතෙක්ද." සුපිරි තරු ජීවිතය ගතකරන්නේ සුඛෝපභෝගීවය. මක්නිසාද ඔවුන් රසිකයන්ගෙන් ගන්නට හැකි හැමදේම රැගෙන ප්‍රමාණයට වඩා වියදම් කරමින් ජීවත්වෙති. යේසුස්වහන්සේ දෙස බලමු. සතුන් සිටි ගඳ ගසන ගාලක ඉපදුනසේක. උන්වහන්සේගේ ජීවිත රටාව ඉතා සරළ විය. සුඛෝපභෝගී ජීවිතයක් ගත නොකළසේක. තමන්ව පුම්බා ගැනීමට නොපැමිණිසේක. සැබවින්ම උන්වහන්සේ පැමිණියේ ඔබත් මාත් උදෙසා තම ජීවිතය දීමටය. අප ගායනා කළ ගීතයේ සමහර කොටස් ඔබ කියෙව්වොත් යේසුස්වහන්සේ ගැන කියා ඇති දේවල්වල සමහර මූලික වැරදි දේවල්ද තිබේ. ඔබට සැබෑවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කවුද කියා පෙන්වීමට මට අවශ්‍යයයි-ඉතා විශාලම තරුව වූ යේසුස්වහන්සේ ඉපදෙන්නට වසර 400කට පෙර සිටි යෙසායා අනාගතවක්තෘ 53:2-4 කියා ඇති ආකාරයට *"උන්වහන්සේ ළා පැලයක් මෙන්ද වියළි බිමෙන් මතුවෙන අංකුරයක් මෙන්ද ඔවුන් ඉදිරියේ හටගත්සේක. උන්වහන්සේට රුවවත් ශෝභනකමවත් නැත; අප විසින් උන්වහන්සේ දකින විට උන්වහන්සේ කෙරේ ආශාවීමට ලක්ෂණකමක්ද නැත. 3 උන්වහන්සේ මනුෂ්‍යයන් විසින් සුලුකොට එපා කරනු ලැබූසේක; වේදනා ඇත්තාවූ දුක දන්නාවූ මනුෂ්‍යයෙක්ය. මනුෂ්‍යයන් විසින් තමුන්ගේ මුහුණ සඟවාගන්න කෙනෙකු මෙන්, උන්වහන්සේ සුලු කරනු ලැබූසේක. අපිද උන්වහන්සේ නොසැලකුවෙමුව. 4 සැබවින්ම උන්වහන්සේ උසුලාගත්තේ අපේ දුක්ය. දරාගත්තේ අපේ ශෝකය. එසේවී නමුත් උන්වහන්සේ දඬුවමද දෙවියන්වහන්සේගෙන් පහරද පීඩාවද ලැබූ කෙනෙකැයි අපි සිතීමුව."*

දෙවියන්වහන්සේ උන්වහන්සේට තුවාල කළේවත්. පහර දුන්නේ වත් දඬුවම් කළේවත් නැත. එසේ කළේ අපිය. පිලිප්පි 2:6-11 අප කියවන ආකාරයට එසේ වුනේ අපේ පාපී ස්වභාවය නිසා යේසුස්වහන්සේ උන්වහන්සේට තිබුණු සියල්ල වූ, දෙවියන්වහන්සේගේ රූපාකාරය දරනසේක් දෙවියන්වහන්සේට සමානව සිටීම අල්ලාගෙනම සිටිය යුතුවූ වස්තුවකැයි නොසිතා 7 එය ඉවත්කර දාසයෙකුගේ ස්වරූපය ගෙන, මනුෂ්‍යයන්ගේ සමානත්වයට පැමිණිසේක. 8 මනුෂ්‍යාකාරයෙන් සිටිය කලත් මරණය, එසේය කුරුසියේ මරණය දක්වා කීකරුවූසේක. 9 එබැවින් දෙවියන්වහන්සේ උන්වහන්සේව ඉතා උසස්කොට, සියලු නාමවලට වඩා උසස් නාමය උන්වහන්සේට දුන්සේක. 10 එසේ කළේ, ස්වර්ගයෙහිද පොළොවෙහිද පොළොව යටද සියල්ලන් **යේසුස් යන නාමයෙන්** දණ නමන පිණිසත් 11 යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ස්වාමින්වහන්සේ බව පියවූ දෙවියන්වහන්සේගේ ගෞරවය සඳහා සියලු දිව්වලින් ඊත්තුගන්න පිණිසත්ය.

ඉතින් යේසුස්වහන්සේ විශාලම තරුවක්ද නැද්ද? මුලු විශ්වයේම මෙවැනි දෙයක් හෝ එයට ආසන්නවූ යම් දෙයක් කර තිබෙන්නේ වෙන කවුද? උන්වහන්සේව මේ පහර දීමෙන් සහ තුවාල කිරීමෙන් බේරා ගන්නා පිණිස දේවදූතයන් මහා හමුදාවක් ගෙන්වා ගැනීමට හැකියාව තිබුණි. නමුත් යේසුස්වහන්සේ ආවේ ඒ අරමුණ ඉටුකරන පිණිසමය. යොහන් 3:16 අපට මෙසේ කියයි: ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙනතරම් මනුෂ්‍ය වර්ගයාට ප්‍රේම කළසේක, එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහා ගන්නා සෑමකෙනෙක්ම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ඉතාමත්ම වටිනාම ත්‍යාගය දුන්සේක. යේසුස්වහන්සේ එවනු ලැබුවේ අපව වරදට පත්කරන්නට නොව මනුෂ්‍යත්වය කෙරෙහි වසංගතයක් මෙන් බල පැවැත්වුනු පාපය සහ පාපයේ බලයෙන් අපව මුදවා ගන්නා පිණිසය. යේසුස්වහන්සේ ඔබට බලාපොරොත්තුවක් සහ ඔබ සිටින තත්වයෙන් එලියට එන්නට මාර්ගයක් සපයා දෙනසේක. උන්වහන්සේ අනුගමනය කරනවා හැර එයට වෙනත් බැඳීමක් අමුණා නැත. යේසුස්වහන්සේ ආවේ ඇයි සහ උන්වහන්සේ අප වෙනුවෙන් කළේ මොනවාදැයි කීමට බොහෝ බයිබල් පද තිබෙන නමුත් ඒවා පෙන්වා දීමට තව වැඩිපුර වෙලාවක් අවශ්‍යයි. යොහන් 10:10 යේසුස්වහන්සේ මෙසේ කියයි: සොරාගේ අරමුණ සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්නටත්ය. මාගේ අරමුණ නම් ජීවනය දීමටත් එය බහුල ලෙස දීමටත්ය.

ප්‍රශ්නය නම්: ඔබ ජීවිතයේ අරමුණ සහ අර්ථය සොයමින් සිටිනවාද? සොරකම් කරන්ටත් මරන්ටත් විනාශ කරන්නටත්

අරමුණු කරගත් සොරාවන සාතන්ගේ අත්වලින් පීඩා විඳ තිබෙනවාද? එම දේම නැවත නැවත කරමින් වෙනස් ප්‍රතිපලයක් බලාපොරොත්තුවීම නිශ්ඵලය. අප බොහෝවිට අප එකම ජීවිත රටාවක් නැවත නැවත පවත්වා ගනිමින් වෙනසක් බලාපොරොත්තු වන්නෙමු. ඒත් එය කිසිදාක ඇති නොවෙයි. ඔබ වෙනුවෙන් සියල්ලම අත්හැර දැමූ, විශාලතම තරුව වන යේසුස්වහන්සේට ඔබේ ජීවිතයේ ඉඩ දීමෙන් නමුත් අද ඒ සියල්ල වෙනස් විය හැකියි. ඔබ පලබර ජීවිතයකට ආශා කරන්නේ නම් එය ඇති කර දිය හැකි එකම පුද්ගලයා වන යේසුස්වහන්සේ වෙතට පැමිණෙන්න. අපි සෑමදෙනාම පව්කර තිබෙන බව අප සියලුම දෙනාට පොදු කරුණක් බැවින් අපව නිවැරදිව හරි ගැස්වීමට අප සෑම දෙනාටම ගැලවුම් කරුවෙක් අවශ්‍යයි. මේ සියල්ලටම වඩා අපටම අපව හරිගස්වා ගත හැකිනම් මේ ලෝකය මීට වඩා යහපත් ස්ථානයක් වෙනවා ඇති නේද? ඔබටවත් මටවත් අපව හරිගස්සා ගැනීමට නොහැක. ඒත් ඔබව සෑදුවාවූ අගයකරන්නාවූ තැනැත්තා නිසා යේසුස්වහන්සේට එය කරන්නට පුලුවනි.

ඉතින් විශාලතම තරුව වන  යේසුස්වහන්සේ සමග ඔබ කරන්නට යන්නේ මොනවාද? ඒක තවත් හොඳ පාස්කු ඉරිදා දේශණාවක්, චොකලට් සහ පාස්කු හාවුන් පමණක් වෙන්නට යනවාද? නැත්නම් ඔබ මේ අපූරු පුද්ගලයා වන යේසුස්වහන්සේව පෞද්ගලිකව අත්දකින දවසක් වේවිද? මම ඔබට අපේ සභාවට එකතුවීමට හෝ යම් කිසි අද්භූත දෙයක් කරන්නට කියන්නේ නැහැ. මම ඉල්ලන්නේ, ඔබේ ජීවිතය සහ ඔබ සිටින තත්වය යහපත් අතට හරවන පිණිස ඔබව වෙනස් කරන්නට යේසුස්වහන්සේට අවස්ථාවක් දෙන්න කියා පමණයි.

අද යම්කිසි වෙනස් දෙයක් කිරීමට ඔබ කීදෙනෙක් අධිෂ්ඨාන කරගන්වාද?

මම සරල යාච්ඤාවක් කරන්නට යනවා ඔබට එය මා අනුව කිව හැකියි. අප පව් කර තිබෙන බව ඒත්තුගෙන සියලුම පව් ගැන පසුතැවිලිවී (ඔබේ මනස වෙනස්කරගෙන) යේසුස්වහන්සේගෙන් සමාව ඉල්ලන්න කියා බයිබලය අපට කියයි.